විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2022.12.06

පළාත් ඉංජිනේරු කාර්යාංශය

2022 වර්ෂයේ IV කාර්තු වෙහි IV වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2022.12.06 දින නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කාර්යාලයේ දී පැවැත් වූ අතර එහි රැස්වීම් වාර්තාව පහත ඉදිරිපත් කරමි.

2022.12.06 වන දින ප.ව.2.00 ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) වැ.බ. ජී.ඩබ්.පී.පෙරේරා මියගේ ප්‍රධානත්වයෙන් සහ එතුමිය විසින් පැමිණ සිටි සියළු නිලධාරීන් පිළිගැනීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කෙරුණි.

සහභාගී වූ නිලධාරීන්

01. ජී.ඩබ්.පී.පෙරේරා මිය - නියෝජ්‍ය ප්රධාන ලේකම් (ඉංජිනේරු) වැ.බ. - පළාත් ඉංජිනේරු කාර්යාංශය
02. ආර්.පී.ගුණවර්ධන මිය - අධ්‍යක්ෂ (ගොඩනැගිලි) - පළාත් ඉංජිනේරු කාර්යාංශය
03. ටී.කේ.ආර්.දිලේශිකා මිය - ප්‍රධාන ගණකාධිකාරි - පළාත් ඉංජිනේරු කර්යාලය
04. එස්.ඒ.ඩී.පී.ප්‍රියදර්ශනී මිය - විගණන අධිකාරි - ජාතික විගණන කාර්යාලය
05. ඩී.ඩී.චන්ද්‍රානි සේනවිරත්න මිය - අභ්‍යන්තර විගණක - අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව (බ.ප.)
06. පී.එල්.ඩී.ඒ.එස්.පනාගොඩ මිය - අධ්‍යක්ෂ ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය
07. ඒ.කලංගම මයා - මූලස්ථාන ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය
08. එල්.එම්.ඩී.ආර්.ද මෙල් මිය - ගණකාධිකාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය.
09. ජේ.එන්.වික්‍රමරත්න මයා - ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය
10. ඩබ්.අයි.නිලාන්ති මෙය - මුදල් සහකාර - පළාත් ඉංජිනේරු කාර්යාංශය
11. ඩබ්.එන්.සී.කුරේ මිය - කළමනාකරණ සහකාර - පළාත් ඉංජිනේරු කාර්යාංශය
12. වී.ජී.එන්.ශ්‍යාමලී මිය - කළමනාකරණ සේවා නිලධාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය
13. එස්.කේ.යු.පී.සූරියආරච්චි මයා - සංවර්ධන නිලධාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය

ප්‍රාදේශීය ඉංජිනේරුවරු මෙම රැස්වීම සඳහා Zoom තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වන ලදි.

1. ඒ.කේ.රුවන් අලවත්ත මයා - ප්‍රාදේශීය ඉංජිනේරු මීගමුව.
2. එච්.ඒ.කේ.ආර්.පෙරේරා මයා - ප්‍රාදේශීය ඉංජිනේරු හොරණ.
3. එග්.බී.සම්පත් මයා - ප්‍රාදේශීය ඉංජිනේරු පානදුර.
4. එච්.එස්.චන්දන මයා- ප්‍රාදේශීය ඉංජිනේරු මිනුවන්ගොඩ.
5. ආර්.ඒ.විජයප්‍රිය මයා - ප්‍රාදේශීය ඉංජිනේරු බියගම.
6. ඩී.සී.එන්.කලන්සූරිය මයා - ප්‍රාදේශීය ඉංජිනේරු රත්මලාන.
7. එල්.ඩී.ගලබඩ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු ගම්පහ.
8. ඒ.ඒ.ද සොයිසා මයා - ප්‍රාදේශීය ඉංජිනේරු හෝමාගම.
9. ඩබ්.ජී.ආර්.වේලාතන්ත්‍රි මයා - ප්‍රාදේශීය ඉංජිනේරු මතුගම.
10. පී.ආර්.මධුරංග මයා - ප්‍රාදේශීය ඉංජිනේරු වත්තල.
11. පී.ඩී.ආර්.නදීරා මිය - ප්‍රාදේශීය ඉංජිනේරු කොළඹ.
12. ජී.ඩී.විපුලසේන මිය - ප්‍රාදේශීය ඉංජිනේරු බත්තරමුල්ල.
13. එස්.එස්.මිල්ලනියගේ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු කළුතර.

## 01. පසුගිය විගණන කමිටු වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීම

| | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය/වගකීම |
|---|---|---|---|
| 01 | නව පළාත් සහා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සඳහා පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට මුදල් ගෙවීම පිළිබඳව | පළාත් ඉංජිනේරු කාර්යාලයෙන් නිකුත්කර ඇති අග්‍රිම මුදලින් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ මේ වන විට ඉතිරිව ඇත්තේ රු.15,158,827.09 බව වාර්තා කර ඇති බවත්, එම මුදල ඉංජිනේරු කාර්යාංශය වෙත ලබා දෙන ලෙස 2022.11.24 දින එම ආයතනයේ සමානාධිකාරිට ලිඛිතව දන්වා ඇති බවත් ප්‍රධාන ගණකාධිකාරි පවසන ලදි. | ඉතිරි මුදල පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ගෙන්වා ගැනීමට තීරණය විය. |
| 02 | "Complain Management" විගණන විමසුම<br>අංක:<br>WNP/CB/R/EB/2020/AQ/5 හා 2020.02.10 | මෙම මෘදුකාංගය භාවිතා කිරීම සම්බන්ධයෙන් ITRDA ආයතනය පුහුණු දේශක නිලධාරි විසින් පුහුණු 2022.10.10 දින සිදු කල බව ඒ සඳහා පළාත් සහා ගොඩනැගිල්ලේ පිහිටි ආයතනවල සේවය කරන නිලධාරින් 39 ක් සහභාගි වු බවත් පැමිණිලි යොමු කිරිමට අදාල නිලධාරින් සම්බන්ධ කර ගන්නා ලෙස අදාල ආයතන ප්‍රධානින් දැන්වත් කිරිමට කටයුතු කළ බවත් මුලස්ථාන ඉංජිනේරු පැහැදිලි කරන ලදි.<br>ජාතික විගණන කාර්යාලයේ නිලධාරි දෙදෙනෙකු පුහුණුව සඳහා සහභාගි වුවද මෙම මෘදුකාංගයට ඇතුල් විමට නොහැකි බවත් මෙම මෘදුකාංගයට ඇතුල්විම සඳහා ලියාපදිංචි විය යුතු බවත් USER NAME එකක් අවශ්‍ය බවත් එය ලබාගත යුත්තේ කාගෙන්ද යන්න පිළිබද විගණන අධිකාරි විමසන ලදි.<br>මෙම මෘදුකාංගයට ඇතුල්විමට අදාල User Name ලබා දෙන්නේ ITRDA ආයතනයෙන් බවත් එ සඳහා එම ආයතනයේ සභාපති වෙත දැන්විය යුතු බවත් මුලස්ථාන ඉංජිනේරු පවසන ලදි. | එදින පුහුණුව සඳහා සහභාගිවූ සියලු නිලධාරින්ට User Name ලබා දිමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ITRDA ආයතනය වෙත දන්වා යැවිම තීරණය විය.<br>මුලස්ථාන ඉංජිනේරු |
| 03 | මාසික බැංකු සැසඳුම් | මේ වන විට සියළුම කාර්යාල විසින් මෘදු පිටපත එවන බවත් ඒ ආකාරයෙන්ම දිගටම කරගෙන යන ලෙසත් අභ්‍යන්තර විගණක ප්‍රකාශ කරන ලදි. මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස අදාල ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ට නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) විසින් දැනුවත් කරන ලදි. | ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි සියළු ප්‍රාදේශිය ඉංජිනේරුවරු |
| 04 | අත්තිකාරම් 'බී' ගිණුමට අදාලව ණය අය නොවිම. | මියගිය හා විශ්‍රාම ගිය පී.ජී.එච්.අබේවික්‍රම මිය, එන්.සිරිතිලක මයා, ඩී.ජී.කේ.කුමාරසිරි මයා, යන නිලධාරින්ගේ ණය ශේෂ සත්‍ය වශයෙන්ම ඉංජිනේරු කාර්යාංශට අයවී ඇති අතර, කේවල ශේෂ ලැයිස්තවේ පමණක් , එනම් සේවක ණය ලේඛණයෙන් ඉවත් නොකිරීම හේතුවෙන් නොපිය වූ ණය ශේෂ ලෙස පොත් වල පෙන්නුම් කරන අතර, මෙම ණය ශේෂය පොත් වලින් ඉවත් කිරීම සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ගේ නිර්දේශ සහිතව, අනුමැතිය ලබා ගැනීම සඳහා 2022.06.21 දිනැති ලිපිය | ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි |

| | | | |
|---|---|---|---|
| | | මගින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය ) මගින් ඉල්ලීම් කර ඇත. 2022.07.21 වන දිනැති ලිපිය මගින් පැහැදිලි වාර්තාවක් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති අතර, ඒ අනුව 2022.08.04 වන දින ඊට අදාල පිළිතුරු ලබා දී ඇත.<br>උක්ත ලිපිය මගින් ඉංජිනේරු කාර්යාංශයේ පොත් වලින් ඉහත ණය ශේෂ ඉවත් කර ගන්නා බවත්, ඒ අනුව පළාත් භාණ්ඩාගාරයේ භාණ්ඩාගාර සැසඳුම් ප්‍රකාශයේ ආර්මිභක ශේෂය නිවැරදි කර ගැනීමට කටයුතු කරන ලෙස දන්වා  යවා ඇත. නමුත් එසේ භාණ්ඩාගර සැසඳුම් ප්‍රකාශයේ ආරම්භක ශේෂ වෙනස් කල නොහැකි බවත්, ඒ සඳහා දෙපර්ශවය සමඟ සාකච්චාවක් මගින් විසඳමට කටයුතු කරන ලෙස දන්වා ඇත. ඒ අනුව අදාල සාකච්ඡාව සඳහා නියමිත දිනය නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) මගින් ලද පසු, එමඟින් ලැබෙන තීරණය අනුව කටයුතු කරන බවත්.<br><br>02.පළාත් පාලන ආයතන වෙත ස්ථාන මාරු ලබා ඇති නිලධාරීන්ගේ ණය ශේෂ එකවර පියවන ලෙස අදාල පළාත් පාලන ආයතන වෙත දන්වා ඇති බවත්, එම ලිපි වල පිටපත් පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා ඇති බවත්, එම ලිපි සඳහා පිළිතුරු ලෙස අදාල පළාත් පාලන ආයතන මගින් දන්වා ඇත්තේ, ණය ගෙවිම සඳහා රජය මගින් මුදල් පළාත් පාලන ආයතන වෙත ලබා නිදහස් නොකරන බැවින් හා ණය ගෙවීම සඳහා පළාත් පාලන ආයතන විසින් උත්පාදනය කර ගන්නා ලද ආදායම් මගින් සිදු කරන බැවින්, ණය ශේෂ එකවර පියවිය නොහැකි බවයි.<br>නමුත් පළාත් පාලන කොමසාරිස් මගින් 2022.10.28 වන දිනැති ලිපිය මගින් ණය ශේෂ එකවර පියවීම ට අදාල සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස දන්වා ඇති අතර, ඒ අනුව කටයුතු කරන ලෙස දන්වමින් අදාල පළාත් පාලන ආයතන වෙත ලිපි යවා ඇති බවත් ප්‍රධාන ගණකාධිකාරි පැහැදිලි කරන ලදි. | |
| 05 | කල් ඉකුත්වූ තැන්පතු | ළඟම පාසැල හොඳම පාසැල ව්‍යාපෘතියේ මුදල් නොමැතිකම නිසා ව්‍යාපෘති අවසන් කල නොහැකි  ඇති බවත්, රඳවාගත් මුදල් නිදහස් කළ නොහැකිව ඇති බවත්, අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් ලබන වසර තුලදී මුදල් වෙන්තර ගැනිමට  අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කරමින් පවතින බවත්, ඊට අදාල කොරතුරු මේ වන විමට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බවත් නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) දැන්වසන ලදි. | නි.ප්‍ර.ලේකම් (ඉංජිනේරු) ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි / සියලුම ප්‍රාදේශීය ඉංජිනේරු |

| | | | |
|---|---|---|---|
| 2.8 | මීගමුව ධීවර සමිතිය<br><br>අවිස්සාවේල්ල ඉඩම | බ.ප.ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති පළාත් ඉංජිනේරු කාර්යාංශ විගණකාධිපති වාර්තා විමර්ශන කමිටුව 2019 සාකච්ඡාවේදි මීගමුව ධීවර සමිති ගොඩනැගිල්ල පළාත් සභාව සතු දේපලක් බැවින් ග්‍රාම නිලධාරි දැනුවත් කර පොලිසියේ පැමිණිල්ලක් දමා ඉබි යතුරු කඩා ඉවත් කිරිමට කටයුතු කිරිම සුදුසු බව ප්‍රධාන ලේකම් විසින් පෙන්වා දෙන ලදි. ඒ බව මීගමුව ප්‍රාදේශිය ඉංජිනේරු දැනුවත් කර ඇත. ප්‍රවේශ මාර්ග සම්බන්ධයෙන් වාර්තාවක් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරිමට කටයුතු ඇත.<br><br>අවිස්සාවේල්ල ඉඩම සහිත ගොඩනැගිල්ල සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු වාර්තාවක් ඉදිරිපත් කර ඇති බවත්. ඒ පිළිබඳව ප්‍රධන නීති නිලධාරි වෙත දන්වමින් නව ගිවිසුමක් සකස් කර ගැනිමට අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට කටයුතු කර ඇත. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / පරිපාලන නිලධාරි |
| 3.1 | ලිපිගොනු කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ මෘදුකාංග පද්ධතිය (DMS) | මෙම මෘදුකාංග මඟින් උපදේශන අංශය මේ වන විට කටයුතු කරන බවත්, ආයතන අංශයේ දෛනික තැපැල ද දැනට මෙම මෘදුකාංගය මඟින් පවත්වාගෙන ගියද එය ප්‍රායෝගිකව ගැටළු සහගත බවත් මේ සම්බන්ධයෙන් ආදාල ආයතනය සමඟ සාකච්ඡාවක් 2022.12.08 දින පැවැත්වෙන බවත් මෘදුකාංගයට අදාල අනෙකුත් ක්‍රියාවලින් 2022.12.15 වන විට අවසන් කර 2022.12.31 වන විට මෙම මෘදුකාංග පද්ධතියේ ක්‍රියාවලින් අවසන් කිරිමට කටයුතු කරන බව අදාල ආයතනය දන්වා ඇති බව ඉංජිනේරු හා නි.ප්‍ර.ලේ .(ඉංජිනේරු) පැහැදිලි කරන ලදි.<br><br>කාලයක් ගතවූ පසු යම් තොරතුරක් විමසුවහොත් මේ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග පිළිබඳ සාරාංශයක් ලබා ගැනීමේ හැකියාවක් නොමැති නම් ඒ සම්බන්ධයෙන් අදාල ආයතනය සමඟ සාකච්ඡා කර එය ඇතුලත් කර ගැනිමට කටයුතු කරන ලෙසත් විගණන අධිකාරි විසින් පැහැදිලි කරන ලදි. | නි.ප්‍ර.ලේ. ඉංජිනේරු/ අධ්‍යක්ෂ ඉංජිනේරු / ගොඩනැගිලි අධ්‍යක්ෂ |

**2 ) විගණන අධිකාරිගේ අදහස් හා පැහැදිලි කිරීම**

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | 2018, 2019, 2020 වර්ෂවල බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ල සඳහා පළාත්බඳ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හා බස්නාහිර පළාත් තොරතුරු තාක්‍ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය (ITRDA) මිලදී ගෙන ඇති වත්කම් නිවැරදිව ගිණුම්ගත කර 2022 වසරේදීවත් මෙම විගණන ඡේදය ඉවත්කර ගැනීමට කටයුතු කරන ලෙසත්, |
| 2 | රාජ්‍ය පරිපාලන චක්‍රලේක ප්‍රකාරව නිල වාහන හිමි නිලධාරින්ගේ නිල වාහනයට සුපිරි ඩීසල් ගැසුවද ඉන්ධන දීමනා ලබා ගැනීමේදි සාමාන්‍ය ඩීසල් සඳහා වන මුදල ලබා ගන්නා ලෙසත්. |
| 3. | නිල වාහන රියදුරන්ගේ ධාවන සටහන්හි ගිය දුර ප්‍රමාණය සටහන් නොකරන්නේ නම් එය සඳහන් කරන ලෙසත්, |
| 4. | පළාත් ඉංජිනේරු කාර්යාලයේ විගණන කළමනාකරණ කමිටු සඳහා සහභාගිවන අවසාන රැස්වීම විය හැකි බවත්, මෙතෙක් තමා වෙත ලබාදුන් සහයට ස්තුතිය පළකරන ලදි. |

**(3) අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණනකගේ අදහස් හා පැහැදිලි කිරීම**

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | බැංකු සැසඳුම් ඉදිරිපත් කිරීම ඉතාම සතුටු දායක බවත්, තවදුරටත් කොළඹ ප්‍රාදේශිය ඉංජිනේරු කාර්යාලයේ හයමාසය ඉක්මවූ තව එක් චෙක්පතක් ඇති බවත් |
| 2. | ව්‍යාපෘති ඇස්තමේන්තුවල අමතර වියදම් හා ඇස්තමේන්තුගතකර ඇති අයිතමයන්ගේ සිදුකරන වෙනස් කම් හැකිතාක් දුරට අවමකර ගැනීමට කටයුතු කරන ලෙස, |
| 3. | මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට පරීක්‍ෂා කිරිමේදිඅයත් කුඩාපාඩුව ප්‍රාථමික විද්‍යාලයේ ගොඩනැගිල්ලේ වැඩ තවම නිමකර නොමැති බවත්, |
| 4. | ඉන්ධන ඇණවුම්වල රියදුරු අත්සන, වාහන අළුත්වැඩියාවලදි ඉවත් කරනු ලබන කොටස් නිසි පරිදි ගබඩා ගත නොකර ඇති බවත්, වාහන අංකය හා තව අඩුපාඩු පැවති බවත්, දෛනික ධාවන සටහන් පොත් තුලනය කර නොතිබු බව නිරීක්‍ෂණය වූ බවත් |
| 5. | වැට් සක්‍රිය ද යන්න හා වැඩ් ලේඛනයක පවත්වා ගෙන ලෙසත් |

<u>භාණ්ඩාගාර නියෝජිතගේ අදහස් හා පැහැදිලි කිරීම්</u>

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | |

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීම ඉතා වැදගත් බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) තනතුරට පත්වූ දින සිට තම රාජකාරි කාලය තුල ලද විගනණ විමසුම් සඳහා සාර්ථකව පිළිතුරු විගණනය වෙත යොමුකර ඇති බවත්, විගණනයෙන් ලබාදෙන ලද පැහැදිලි කිරීම් රාජකාරි කටයුතු වලදී ඉතා ප්‍රයෝජනවත් වූ බවත්, ඒ සම්බන්ධයෙන් තම ස්තූතිය ප්‍රකාශ කරන බවත්, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට සහභාගිවන අවසන් රැස්වීම බවත්, රැස්වීම සඳහා සහභාගි වීම සම්බන්ධයෙන් විගණන අධිකාරි, අධ්‍යකෂ - අභ්‍යන්තර විගණක, හා අනෙකුත් සියළු නිලධාරින්ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ස්තුතියඵල කිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු පස්වරු 16.00 ට පමණ අවසන් කරන ලදී.

ජී.ඩබ්.පී.පෙරේරා,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු),
පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)